# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ආරක්ෂක අමාත්‍යාංශය

## AIIB මගින් අරමුදල් සැපයෙන ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)

## ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PIU) - නාවලපිටිය

# ඇබෑර්තු

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසින් අරමුදල් සැපයෙන, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියෙහි (RLVMMP) ඉලක්කය වන්නේ නායයෑමේ අවදානම සහ බරපතලකම අවම කිරීම, ජීවිත හානි සහ ආර්ථික හානි අවම කිරීම වේ. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස සේවය කරයි. මෙම ව්‍යාපෘතිය සංරචක හතරකින් සහ නායයෑමේ අවදානම් ස්ථාන 127 කින් සමන්විත වන අතර, සම්පූර්ණ පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 101.3 කි. මෙම ව්‍යාපෘතිය යටතේ බදුල්ල, මහනුවර, මාතලේ, කෑගල්ල, රත්නපුර, නුවරඑළිය, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන් හි (ස්ථාන 127) ක නායයෑම් අවදානම අවම කිරීමේ වැඩ සහ දුම්රිය මාර්ග සමග ඇති අස්ථාවර ප්‍රදේශයන්හි නාය යෑමේ අවදානම අවම කිරීමේ කටයුතු සිදුවේ. උඩරට දුම්රිය මාර්ගයේ කිලෝමීටර 225 ක දුරකින්යුත් ව්‍යාපෘති ස්ථාන 22ක් ආවරණය වන පරිදි 8 පැකේජය යටතේ ප්‍රදානය කරන ලද දළ වශයෙන් ලංකා රුපියල් බිලියන 3.60 ක වටිනාකමින් යුත් කොන්ත්‍රාත් 03ක ඉදිකිරීම් අධීක්ෂණය සඳහා නාවලපිටියේ ස්ථාපිත කෙරෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයෙහි (PIU) පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන්, මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. සෞඛ්‍ය සහ සුරක්ෂිතතා විශේෂඥ (තනතුරු 01- PS4 මට්ටම) අවම සුදුසුකම් සහ පළපුරුද්ද**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සාර්ථකව සම්පූර්ණකර තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකමක්

සමග

සුදුසුකම් ලැබීමෙන් පසු, කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 8ක පළපුරුද්ද

හෝ

ආ) අදාළ ක්ෂේත්‍රයෙහි, දීප ව්‍යාප්ත රාජ්‍යසේවයේ II/III ශ්‍රේණියේ හෝ සමාන තත්ත්වයේ නිලධාරියෙක්

සහ

II/III ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 08ක පළපුරුද්ද

**02. පාරිසරික නිලධාරි (තනතුරු 03- PS 6 මට්ටම)**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ආදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සාර්ථකව සම්පූර්ණකර තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් හෝ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකමක් හෝ

අදාළ ක්ෂේත්‍රයේ අදාළ තනතුර සඳහා තෘතීයික වෘත්තීම අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයකින් නිකුත් කරණ ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම

සහ සුදුසුකම් ලැබීමෙන් පසු පාරිසරික සෞඛ්‍ය සහ සුරක්ෂිතතා ක්ෂේත්‍රයන්හි අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද

හෝ

ආ) අදාළ ක්ෂේත්‍රයේ අදාළ තනතුර සඳහා තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6ට නොඅඩු පවීණතා සහතිකයක් ලබාගෙන තිබීම

සහ පාරිසරික, සෞඛ්‍ය සහ සුරක්ෂිතතා ක්ෂේත්‍රයන්හි අවම වශයෙන් වසර 08ක පළපුරුද්ද

හෝ

ඇ) අදාළ ක්ෂේත්‍රයේ අදාළ තනතුර සඳහා තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයකින් නිකුත් කරණ ලද ජාතික සුදුසුකම් මට්ටම 5ට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබාගෙන තිබීම

සහ පාරිසරික, සෞඛ්‍ය සහ සුරක්ෂිතතා ක්ෂේත්‍රයන්හි අවම වශයෙන් වසර 13ක පළපුරුද්ද

**03. තාක්ෂණ නිලධාරී - සිවිල් (තනතුරු 04- PS6 මට්ටම- A කාණ්ඩය)**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකමක් හෝ

අදාළ ක්ෂේත්‍රයේ අදාළ තනතුර සඳහා තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 7ට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබාගෙන තිබීම

සහ සුදුසුකම් ලැබීමෙන් පසු සිවිල් ඉදිරිකිරීම් ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද

හෝ

ආ) අදාළ ක්ෂේත්‍රයේ අදාළ තනතුර සඳහා තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයකින් නිකුත් කරණ ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6ට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබාගෙන තිබීම.

සහ

සිවිල් ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර 08ක පළපුරුද්ද

හෝ

ඇ) අදාළ ක්ෂේත්‍රයේ අදාළ තනතුර සඳහා තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5ට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබාගෙන තිබීම.

සහ

සිවිල් ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර 13ක පළපුරුද්ද

අයදුම්කරන දිනය වන විට අයදුම්කරුගේ වයස අවුරුදු 64ට අඩු විය යුතුය.

බඳවා ගැනීම කොන්ත්‍රාත් පදනම මත, මූලික වශයෙන් මාස හයක (06) කායලක් සඳහා වන අතර, ඉන්පසුව දීර්ඝ කළ හැක. රාජ්‍ය සේවයෙහි, ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා හෝ වෙනත් රාජ්‍ය ආයතනයන්හි අයදුම්කරුවන් අදාළ ආයතනයේ ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් නිදහස් කළ හැකි, නොහැකි බව අදාළ ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2019 හි ප්‍රතිපාදනයන්ට සහ ශ්‍රී ලංකා රජයේ අනෙකුත් අදාළ මූල්‍ය චක්‍ර ලේඛයන්ට යටත්ව වැටුප් ගෙවනු ලැබේ.

සම්පූර්ණ ජීවදත්ත පත්‍රිකාවක් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ සම්බන්ධතා තොරතුරු සහ අදාළ සහතිවල සහතික කරන ලද පිටපත් සමග මෙම දැන්වීම පළ වී දින 10ක් ඇතුළත දී ලියාපදිංචි තැපැල හරහා අයදුම්කරන මෙන් යෝග්‍යතාපූර්ණ අයදුම්කරුවන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.

කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අයදුම්කරණ තනතුර සඳහන් කළ යුතු අතර, අයදුම්පත් පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නාය යාමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය,**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය,**
**99/1, ජාවත්ත පාර, කොළඹ 05.**